# රජයේ අනුග්‍රහය ලත් සමූහ සැකසුම් මධ්‍යස්ථාන

ආර්. පී. එම්. ද සොයිසා විසිනි
(නියෝජ්‍ය ප්‍රධානියා, උපදේශක සේවා දෙපාර්තමේන්තුව)

දේශීය ඉපැයුම් ශක්තිය හා රට සල්ලි ප්‍රමාණය නංවාලීම, අද අප රටට අවශ්‍ය යෙන්ම සපුරාගත යුතු වෙයි. මෙය අත් කර ගත හැකි වනුයේ ජීවන තත්ත්වයන් නගා සිටුවීමෙන් සහ ගොවි ජනතාවගේත්, කුඩා ඉඩම් හිමියන්ගේත් මූලික අවශ්‍යතාවයන් සපුරාලීමෙනි. කුඩා රබර් ඉඩම හිමියන්ට මෙය විශේෂයෙන් අදළ වේ. ගරු වැවිලි කර්මාන්ත ඇමැති, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා විසින් සමූහ සැකසුම් මධ්‍යස්ථාන යෝජනා ක්‍රමයක් අරඹන ලද්දේ හුදෙක් මෙකී අදහස් පෙරදැරි කරගෙනය. මෙම යෝජනා ක්‍රමය ගැන ගරු ඇමතිතුමා පෞද්ගලිකව උනන්දු වූ හෙයින් මෙවැනි මධ්‍යස්ථාන වඩ වඩා ඉදි කිරීම ගැන උද්යෝගයක් ඇති විය. මෙහි ප්‍රතිඵලය වූයේ, වර්ෂයක් ඇතුළතදී පිහිටුවනු ලැබූ මධ්‍යස්ථාන සංඛ්‍යාව, 25 සිට 50 දක්වා වැඩි වීමය. මේ එක් එක් මධ්‍යස්ථානයක් නැරඹීම සඳහා ඇමතිතුමා පෞද්ගලිකවම ගොස්, ඔවුන්ගේ ඕනෑ එපාකම් සහ සේවා තත්ත්වයන් ගැන කුඩා ඉඩම් හිමියන් සමග සාකච්ඡා පවත්වයි. ක්ෂේත්‍ර නිලධාරින්ට මෙන්ම කුඩා ඉඩම් හිමියන්ටද මෙය විශාල අනුබලයකි. රබර් වගා ප්‍රදේශයන්හි පවත්නා තත්ත්වයන් පිළිබඳව ඇමතිතුමාට තිබෙන පුළුල් දැනුම, කුඩා ඉඩම් හිමියන්ට මතුවන සුළු ගැටළු පවා නිරාකරණය කිරීමට ඔහුට ඉවහල්වී ඇත. රබර් කර්මාන්තයේ උන්නතිය ගැන ඔහු අවංකවම උනන්දු වන අතර, එම උනන්දුව හුදෙක් දේශපාලනමය වශයෙන් නොවේ.

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදිතවල තත්ත්වය වැඩි දියුනු කිරීම වස් 1940 වර්ෂයේ සිට ප්‍රයත්න කිහිපයක්ම දැරූ බව සත්‍යවුවද, රජය මගින් සලසන ලද මූල්‍ය සහයෝගිතාව ප්‍රමාණවත් නොවූයෙන්, එතරම් ප්‍රගතියක් අත්වූ වගක් පෙනෙන්නට නොතිබුණි. එහෙත්, 1970 වසර සිට, ඔවුන්ගේ දුම් ගැසූ දර රබර් ෂීට්වල තත්ත්වය දියුණු කිරීමට අවශ්‍ය උපකරණ නොතිබෙන කුඩා ඉඩම් හිමි කණ්ඩායම්වලට විශාල දීමනා සහ ණය පහසුකම් සලසනු ලැබේ.

ප්‍රමාණයෙන් අක්කර 10 ට අඩු කුඩා රබර් ඉඩම් අක්කර 149,000ක් ඇත. මෙම අක්කර ප්‍රමාණයෙන් වාර්ෂිකව ආර්එස්එස් ටොන් 35,000 ක් පමණ නිපදවනු ලැබේ. රබර් වෙළඳාමේ නියැලී සිටින බොහෝ අයට දැන් ඒත්තුගොස් ඇති කරුණක් නම්, කුඩා ඉඩම් හිමියන් විසින් නිපදවනු ලබන ආර් එස් එස් වර්ගය සාමාන්‍යයෙන් නො. 3 වර්ගයට වැටෙන බවයි. ඔහුගේ නිෂ්පාදන ප්‍රමාණය අල්ප බැවින්, උසස් වර්ගයේ ආර්එස්එස් නිපදවීමට අවශ්‍ය රෝල සහ දුම්ගෙවල් ආදී පහසුකම් ඔහුට ලබා ගැනීම දුෂ්කරය. එබැවින්, ෂීට් එකක් ඇඹරීම සඳහා ශත–/05ක්ද, එය දුම්ගැසීම සඳහා තවත් ශත–/05 ක්ද ගෙවීමට ඔහුට සිදුවන අතර, ෂීට් විකිනීම සඳහා ගෙනයාමේදී ප්‍රවාහණ ගාස්තුද ඔහු විසින් දැරිය යුතුවේ. ඔහුගේ ෂීට් නො. 1 ආර්එස්එස් මිලට වඩා අඩු මිලකට විකිණීමට ඔහුට නිරායාසයෙන්ම සිදු වෙයි. මක්නිසාදයත්, ඔහු විසින් පාවිච්චි කරනු ලබන රෝල බොහෝවිට පැරණි ඒවා වන බැවින්, එයින් ඇඹරී ලැබෙන ෂීට් අසමාකාර ඝනකම ඇති ඒවා වේ. තවද, දුම්ගෙවල් සාමාන්‍යයෙන් අසතුටුදායක ඒවා වීමද හේතු වේ. එහෙයින්, කුඩා ඉඩම් හිමියාට වැඩදයි ලෙස සහායදීමක් වස් 1972 වර්ෂය සඳහා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 20 ක් ඇරඹීමටද රජය තීරණය කළාය.

එම මධ්‍යස්ථාන මෙසේය:–

| දැනට ක්‍රියාත්මක වන සමූහ සැකසුම් මධ්‍යස්ථාන | ආදායම් දිස්ත්‍රික්කය |
|---|---|
| 1. හතරලියැද්ද | මහනුවර |
| 2. මිල්ලනිය | කළුතර |
| 3. යටලමත්ත | ගාල්ල |
| 4. තුඩුගල–ඉහළගම | කළුතර |
| 5. දංගම්පොල | කෑගල්ල |
| 6. ගෝවින්න | කළුතර |
| 7. ගලතුර | රත්නපුර |
| 8. පාලුගම | කොළඹ |
| 9. එත්නාවල | කෑගල්ල |
| 10. මලිදූව | මාතර |
| 11. කලල්ගොඩ/තලවතුගොඩ | කොළඹ |
| 12. රංතොටුවිල | ගාල්ල |
| 13. කළුපහන | කළුතර |

නිමකොට තිබෙන සහ ක්‍රියාත්මක කිරීමට සූදානම්ව ඇති මධ්‍යස්ථාන :

| | | |
|---|---|---|
| 1. | පින්නවල | කොළඹ |
| 2. | හෝමාගම | කොළඹ |
| 3. | ඔලබොඩුව | කළුතර |
| 4. | තඹදිය | කෑගල්ල |
| 5. | වලගෙදර | කළුතර |
| 6. | කරපාගල | කළුතර |

ඉදිවන අවසන් අදියරයේ පවතින මධ්‍යස්ථාන:

| | | |
|---|---|---|
| 1. | කඳන | කළුතර |
| 2. | ඕපල්ල | කළුතර |
| 3. | යටගම්පිටිය | කළුතර |
| 4. | තෙප්පනාව | රත්නපුර |
| 5. | හත්කැල්ල | රත්නපුර |
| 6. | වරකාපොළ | කෑගල්ල |

ඉදිවෙමින් පවතින මධ්‍යස්ථාන:

| | | |
|---|---|---|
| 1. | කුඹුක | කළුතර |
| 2. | අමරගෙදර | කළුතර |
| 3. | ඉද්දමල්ගොඩ | කුරුණෑගල |

මෙම වර්‍ෂය සඳහා සංවිධානය කර ඇති එවැනි මධ්‍යස්ථාන 50 කි. ඒවා ඉදි කිරීමේ කටයුතු ලඟදීම ඇරඹීමට විධිවිධාන යොද ඇත.

මෙම යෝජනා ක්‍රමය සාකල්‍යයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඉතා සියුම් විස්තරය ගැන පවා හදරා, එය සකසා ඇත. පළමුකොට, ප්‍රදේශයේ රබර් උපදේශකවරයා විසින් සවිස්තර සමීක්ෂණයක් පවත්වනු ලබයි. මෙම සමීක්ෂණයේදී සියළුම ඉඩම් ගැන විස්තර සලකා බලනු ලැබේ. <u>නිදසුනක්:</u>

1. ඉඩමේ ප්‍රමාණය, වැවිලි ද්‍රව්‍ය පිළිබඳ විස්තර.
2. රබර්වල වයස සහ එහි තත්ත්වය.
3. ප්‍රදේශයට අදළ නැවත වගා කිරීමේ වැඩ පිළිවෙල.
4. කුඩා රබර් ඉඩම් හිමියාට තිබෙන ඇඹරුම් පහසුකම් යනාදිය.

මෙහෙයුම් පහසුව තකා, දිනකට රබර් කිරි රාත්තල් 700 ක් එකතු කරගත හැකි හැතැප්ම $1\frac{1}{2}$–2 අරයක් ඇතුළත මෙම සමීක්ෂණය සීමා කර ඇත. සාමාන්‍යයෙන් සමීක්ෂණය අවසාන යේදී අක්කර 120–140 දක්වා වූ ඉඩම් ප්‍රමාණයකට යොද ගත හැකිය. ඊලඟ පියවර වනුයේ, සමූහ සැකසුම් මධ්‍යස්ථානයක් තැනීම සඳහා ජලය පහසුවෙන් ලබා ගත හැකි සුදුසු ස්ථානයක් තෝරා ගැනීමය. මෙම ස්ථානය සියළුම කුඩා ඉඩම් හිමියන්ට කේන්ද්‍රස්ථානයක්ව පිහිටා තිබිය යුතු අතර, එතරම් ප්‍රමාදයක් හෝ දුෂ්කරතාවක් නොමැතිව ඔවුන් විසින් දිනකදී එකතු කරන රබර් කිරි රැගෙන යා හැකි විය යුතුය. මෙම මධ්‍යස්ථානය පිහිටුවා ගැනීම සඳහා තෝරා ගනු ලබන ස්ථානයට පහසුවෙන් ළඟා වීමට හැකි විය යුතු අතර, එය වගුරු නොවන උස් බිමක් විය යුතුය. ඉකුත් වර්‍ෂය තුළදී ඉදි කළ සියළුම මධ්‍යස්ථාන සම්බන්ධයෙන් බලන කල ඒවා ඉදිවූ භූමිභාගය මුළුමනින්ම තෑගි වශයෙන් හෝ සුළු කුලියකට අවුරුදු 20–25 බද්දකට සෑහෙන පමණ ඉඩම් ලබා ගැනීම අසීරු නොවීය.

ආයතනයේ රබර් රසායන විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන ආදර්ශ සැලැස්මක් සහ බඩු ප්‍රමාණ සටහන් පත්‍රයක් අනුව සමූහ සැකසුම් මධ්‍යස්ථානයක් ගොඩනැගිලි ඉදි කරනු ලැබේ. බාහිර උදුනක් සහිතව රාත්තල් 3,500 ධාරිතාවක දුම්ගෙයක්ද, ඉඩකඩ ඇති පිරියම් කාමරයක්ද, දුම්ගැසූ ෂීට් තබා ගැනීම සඳහා තවත් ගබඩා කාමරයක්ද එම ගොඩනැගිලි–වලට ඇතුළත් වේ. මෙම ආයතනයේ උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීහු

සමිති ගොඩනැගිලි මෙහෙයවීම ගැන උපදෙස් සපයා, ඒවා පරිලෝචනය කරති. සමිතිවල නිලධාරීන් විසින් නියමිත ගිවිසුම් අත්සන් කළ පසු, දීමනාවක් වශයෙන් රු. 8,000/- ක්ද, 10% පොලියකට රු. 10,000/-ක ණයක්ද දෙනු ලැබේ. මෙම මුදල් ප්‍රමාණය ගොඩනැගිලි නිම කිරීමටත්, රෝල සහ වෙනත් උපකරණ මිලට ගැනීමටත් ප්‍රමාණවත් වන බව නිරීක්ෂණය කොට ඇත. ගොඩනැගිල්ල ඉදිකෙරෙන විවිධ අදියරයන් තුළදී, සමූහ සැකසුම් මධ්‍යස්ථානවල අරමුදල්, උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙන් වරින් වර මුදා හරිනු ලැබේ.

<u>සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවන්:</u>

| | | | |
|---|---|---|---|
| ද්‍රව්‍ය | ... | රු. 6750.00 | |
| කම්කරු පිරිවැය | ... | 3000.00 | |
| රෝල සහ භාණ්ඩ | ... | 8250.00 | රු. 18,000.00 |

කුඩා ඉඩම් හිමියන්ට අත්තිකාරම් ගෙවීම සහ දර, අම්ල හා වෙනත් රසායන ද්‍රව්‍ය වැනි සුළු අවශ්‍යතාවන් මිළට ගැනීම සඳහා රු. 1500/- ක කාරක ප්‍රාග්ධන මුදලක් සමිතියට ණය වශයෙන් දෙනු ලැබේ.

සමූහ සැකසුම් මධ්‍යස්ථානයට අවැසි සේවක පිරිස් තෝරාගනු ලබනුයේ ප්‍රදේශයේ කුඩා ඉඩම් හිමියන් අතුරෙනි. ආර්එස්එස් නිෂ්පාදනයෙහිද, පොත් තබා ගැනීම පිළිබඳව හා අලෙවි කටයුතු ගැනද, ඔවුන්ට ආයතනයෙන් පුහුණුවක් ලබා දේ. උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම මධ්‍යස්ථාන නිරතුරුව පිරික්සන අතර, උසස් වර්ගයේ ෂීට් නිපදවීම සඳහා අවශ්‍ය සෑම සහායක්ම ඔවුන් විසින් දෙනු ලැබේ. කුඩා ඉඩම් හිමියන්ට සතියකට වරක් අත්තිකාරම් ගෙවනු ලැබේ. සියළුම සමූහ සැකසුම් මධ්‍යස්ථානයන්හි දෙසතියකට වරක් රබර් විකුණනු ලබන අතර, මීට සහභාගි වන සාමාජිකයිනට මාසය තුළදී සමූහ සැකසුම් මධ්‍යස්ථාන-වලට ගෙනෙනු ලබන රබර් කිරිවලට මුදල් ගෙවනු ලැබේ. ආර්එස්එස් රාත්තලක් සැකසීමේ සාමාන්‍ය පිරිවැය ගණන් බලන ලදුව, එය දැනට ක්‍රියාත්මකව පවතින සමූහ සැකසුම් මධ්‍යස්ථාන සියල්ලක්ම පාහේ සැකසීමේ සාමාන්‍ය පිරිවැය ශත -/10 ටත් ශත -/11 ටත් අතර පවත්නා බව සොයාගෙන ඇත. ණය නැවත ගෙවීම සඳහා රාත්තලකට වැඩිපුර ශත -/02ක්ද, සංචිතයක් සඳහා සෑම රාත්තලකින්ම ශත -/01 ක්ද වෙන් කරනු ලැබේ. මේ අනුව, එක් එක් සාමාජිකයකු සඳහා සකසනු ලබන සෑම ආර්එස්එස් රාත්තලක් සඳහා මුළු අඩු කිරීම පිළිවෙළින් ශත -/13ක් සහ ශත -/14ක් වේ.

අමු කිරෙන් ආර්එස්එස් නිපදවා, අලෙවි කිරීම සඳහා කුඩා ඉඩම් හිමියෙකුට රාත්තලකට ශත -/10ක් හෝ ශත -/20ක් වැය වන අතර, මෙය ෂීට් නිපදවීම සඳහා වැයවූ ඔහුගේ ශ්‍රමය අතහැර ගණන් බැලූ විට ලැබෙන පිරිවැය වේ. කුඩා ඉඩම් හිමියාට සාමාන්‍යයෙන් ගෙවනු ලබන්නේ ආර්එස්එස් නො. 3ට ගෙවනු ලබන මිලය. වත්මන් මිල ගණන් අනුව, මෙකී මිළ ආර්එස්එස් නො. 1 වර්ගයට වඩා සාමාන්‍යයෙන් ශත -/04 ක් හෝ ශත -/05 ක් අඩුය. සමූහ සැකසුම් මධ්‍යස්ථාන මගින් කුඩා ඉඩම් හිමියන්ගේ අමුකිරි, ආර්එස්එස් නො. 1 වර්ගයට සකස් කිරීමෙන් ශ්‍රී ලංකාවට නො. 1 වර්ගයේ උසස් ආර්එස්එස් නිපදවීමට හැකි වනු පමණක් නොව, කුඩා ඉඩම් හිමියාට වඩාත් යහපත් ආදායමක් ලබාදීමද සහතික කෙරේ. මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථාන, අවසානයේදී ක්‍රේප් හෝ කුට්ටි රබර් නිපදවනු ලබන යන්ත්‍රෝපකරණ වලින් මනා ලෙස පරිපූර්ණ වූ කර්මාන්තශාලාවලට පරිවර්තනය කළ හැකි වේ යයි සංවර්ධන වැඩ සටහනින් බලාපොරොත්තු වේ.

(පරිවර්තනය: රියෙන්සි. අයි. පෙරේරා විසිනි)